අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ : 07/2022

මගේ අංකය : MOJ/E16/2/2(10) 2022
අධිකරණ අමාත්‍යාංශය.
2022.05 . 09

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුතුමන්/තුමියන්,
අභියාචනාධිකරණ විනිසුරුවරුතුමන්/තුමියන්,
මහාධිකරණ විනිසුරුවරුතුමන්/තුමියන්,
සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරුතුමන්/තුමියන්,
දිසා විනිසුරුතුමන්/තුමියන්,
දිසා විනිසුරු/මහේස්ත්‍රාත්තුමන්/තුමියන්,
මහේස්ත්‍රාත්තුමන්/තුමියන්,
කම්කරු විනිශ්චයාධිකාර සභාපති/අතිරේක මහේස්ත්‍රාත්තුමන්/තුමියන්,

**අධිකරණ විනිසුරුවන් සඳහා වන සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය.**

අංක අමප/15/0816/621/003-1 හා 2015.07.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, සියලුම විනිසුරුවරුන් සඳහා රු.35,000.00 ක බාහිර ප්‍රතිකාරයන්ට යටත්ව රු.500,000.00 ක වාර්ෂිකව අළුත් වන රක්ෂණාවරණයක් හිමිවේ.එම රක්ෂණාවරණයේ උපරිම ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ප්‍රතිලාභී විනිසුරුවරුන්/වරියන්ට ලබා දීමේ අරමුණ ඇතිව අධිකරණ විනිසුරු රක්ෂණයට අදාල ලියාපදිංචි හා ගෙවීම් ක්‍රියාවලිය සම්බන්ධව 2022 වර්ෂයේ සිට පහත පරිදි ක්‍රියා කළ යුතු වේ.

2. රක්ෂණය කල්පිරෙන දිනට සතියකට පෙර එම වර්ෂය සඳහා තෝරාපත් වූ රක්ෂණ සමාගමට සම්බන්ධ තොරතුරු ඇතුලත් නිවේදනය හා ලියාපදිංචිය සඳහා යොමු කළ යුතු අයදුම්පත අධිකරණ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ වාර්ෂිකව පල කරනු ලබන අතර මනාපය පල කරන විනිසුරුවරුන් අදාල අයදුම්පත සම්පූර්ණ කොට සති දෙකක් ඇතුලත judgesinsurancemoj@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනය වෙතද, එහි මුල් පිටපත ලේකම්, අධිකරණ අමාත්‍යාංශය වෙතද යොමු කල යුතුය. විනිසුරුවරයා වාරික මුදල් ගෙවීමට බලාපොරොත්තු වන්නේ කුමන අධිකරණ කලාපය හරහාද යන්නත් , අයදුම්කරන රක්ෂණ කාණ්ඩය කුමක්ද යන්නත් අයදුම්පතේ නිවැරදිව සඳහන් කළ යුතුය.

3.අමාත්‍යාංශය මගින් එක් එක් අධිකරණය යටතේ ගෙවීම් සඳහා ලියාපදිංචි වී ඇති විනිසුරුවරුන්ගේ තොරතුරු ශ්‍රේෂ්ඨාධිකරණය / අභියාචනාධිකරණය හෝ අදාල මහාධිකරණයන් වෙත දැනුම් දීම සිදු කරනු ලබයි.

4.විනිසුරුවරයාගේ (පවුල් ඒකකය හැර) රක්ෂණාවරණය වෙනුවෙන් 75%ක රජයේ දායකත්වය අධිකරණ අමාත්‍යාංශය විසින් දරණු ලබන අතර විනිසුරුවරයා තෝරාගන්නා රක්ෂණාවරණ කාණ්ඩය අනුව ගෙවිය යුතු ඉතිරි මුදල උපරිම වාරික 04 ක් තුල විනිසුරුවරයා විසින් ගෙවිය යුතු වේ.එම වාරික මුදල් විනිසුරුවරයාගේ වැටුපෙන් අයකර **රක්ෂණ සමාගමේ කළමණාකරු නමින්** ලියන ලද චෙක්පත හා විනිසුරුවරුන්ගේ නම හා ජාතික හැඳුනුම්පත් අංකය ඇතුලත් කරන ලද ප්‍රේෂණ ලැයිස්තුවක්(Remittance list) අධිකරණ අමාත්‍යාංශයට පිටපතක් සහිතව රක්ෂණ සමාගම වෙත යොමු කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය / අභියාචනාධිකරණය හෝ අදාල මහාධිකරණයන්හි ගණකාධිකාරී/රෙජිස්ට්‍රාර් විසින් සිදු කළ යුතුය.

තවද රජයේ දායකත්ව මුදල ගෙවීම සඳහා, පළමු වාරිකය රක්ෂණ සමාගම වෙත යොමු කරන ලද විනිසුරුවරුන්ගේ ප්‍රේෂණ ලැයිස්තුවේ සත්‍ය පිටපතක් බවට තහවුරු කරන ලද පිටපතක් ශ්‍රේෂ්ඨාධිකරණය / අභියාචනාධිකරණය/ මහාධිකරණයන් හි ගණකාධිකාරී/රෙජිස්ට්‍රාර් විසින් පළමු වාරිකය අයකර සති 02 ක් ඇතුලත අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය.

5. පළමු වාරිකයේ චෙක්පත ඉහත පරිදි ශ්‍රේෂ්ඨාධිකරණය / අභියාචනාධිකරණය/ මහාධිකරණයන් හි ගණකාධිකාරී/රෙජිස්ට්‍රාර් විසින් යොමු කළ පසුව රක්ෂණ සමාගම විසින් විනිසුරුවරයා වෙත සාමාජික කාඩ්පත නිකුත් කරනු ලබන අතර, අදාල රක්ෂණ සමාගම විසින් සාමාජික කාඩ්පත් නිකුත් කිරීමෙන් අනතුරුව පළමු වාරිකය ගෙවූ විනිසුරුවරුන් සඳහා 75%ක රජයේ දායකත්ව මුදල ගෙවීම අමාත්‍යාංශය මගින් සිදු කරනු ලැබේ.

6. සම්පූර්ණ වාරික මුදල විනිසුරුවරයා විසින් ගෙවූ පසු තම අධිකරණයට අදාල ගෙවීම් අවසන් කළ විනිසුරුවරුන්ගේ ගෙවීම් සම්බන්ධ සාරාංශ සටහන් ශ්‍රේෂ්ඨාධිකරණය / අභියාචනාධිකරණය හෝ මහාධිකරණයන් හි ගණකාධිකාරී/රෙජිස්ට්‍රාර් මගින් අධිකරණ අමාත්‍යාංශය වෙත දැනුම් දිය යුතු අතර ඒ සඳහා **ආකෘති පත්‍ර 1**යොදාගත යුතුය.

7.අවසාන වාරිකය ගෙවීම් සිදු කරන ඔක්තෝබර් මස අවසානයේ, තම අධිකරණය මගින් ගෙවීම් සිදු කළ සියලු විනිසුරුවරුන්ගේ වාරික මුදල් තුලනය කොට රක්ෂණ ආයතනය වෙත ඉදිරිපත් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය / අභියාචනාධිකරණය හෝ මහාධිකරණයන් හි ගණකාධිකාරී/රෙජිස්ට්‍රාර් විසින් සිදු කළ යුතු වේ.

**එම්.එම්.පී.කේ. මායාදුන්නෙ,**
ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.